සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

# බෞද්ධ ශිෂ්ටාචාරය II
# பௌத்த நாகரிகம் II
# Buddhist Civilization II

**45 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

※ **I කොටසින්** ප්‍රශ්න **දෙකක්** ද, **II කොටසින්** ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

※ සෑම ප්‍රශ්නයකට ම ලකුණු **20** බැගින් හිමි වේ.

## I කොටස

**1.** (i) බ්‍රාහ්මණ වර්ණයට අයත් ස්වධර්ම **හතරක්** නම් කරන්න. (ලකුණු 02යි.)

(ii) බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදායේ සුවිශේෂ ලක්ෂණ **තුනක්** ගෙනහැර දක්වන්න. (ලකුණු 03යි.)

(iii) බුද්ධකාලීන භාරතයේ පැවති රාජාණ්ඩු පාලන ක්‍රමය පිළිබඳ කෙටි විවරණයක් සපයන්න. (ලකුණු 04යි.)

(iv) බුද්ධකාලීන භාරතීය පාලකයන් හා බුදුරජාණන් වහන්සේ අතර පැවති සබඳතා උදාහරණ **පහක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05යි.)

(v) පූරණ කස්සපගේ අකිරියවාදී දර්ශනය සැකෙවින් හඳුන්වා, එය බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් විමසීමට ලක් කරන්න. (ලකුණු 06යි.)

**2.** (i) බුදුරජාණන් වහන්සේ 'සුගත' නාමයෙන් හැඳින්වීමට හේතු වූ සාධක **දෙකක්** නම් කරන්න. (ලකුණු 02යි.)

(ii) බුදුරජාණන් වහන්සේගේ ආදර්ශවත් නායකත්වය ප්‍රකට වන අවස්ථා **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03යි.)

(iii) බුදුරජාණන් වහන්සේගේ ආගමික සහනශීලී ගුණය උදාහරණ **හතරක්** ඇසුරින් ප්‍රකට කරන්න. (ලකුණු 04යි.)

(iv) විශාඛා මහෝපාසිකාවගේ චරිත කථාව ඇසුරින් ගිහි ජීවිතයක සාර්ථකත්වය සඳහා ලබා ගත හැකි ආදර්ශ **පහක්** පෙන්වා දෙන්න. (ලකුණු 05යි.)

(v) වර්තමාන සමාජ ගැටලු අවම කරගැනීමෙහිලා පංචසීල ප්‍රතිපදාවෙන් ලැබිය හැකි පිටිවහල විස්තර කරන්න. (ලකුණු 06යි.)

**3.** (i) "ජයං වෙරං පසවති" යන ධම්මපද ගාථාව නිවැරදිව සම්පූර්ණ කරන්න. (ලකුණු 02යි.)

(ii) ඉහත (i) හි සඳහන් කරන ලද ගාථාවේ අර්ථය ලියා දක්වන්න. (ලකුණු 03යි.)

(iii) ගුරු-ශිෂ්‍ය යුතුකම් හා වගකීම් **දහය** සිගාලෝවාද සූත්‍රයට අනුව නම් කරන්න. (ලකුණු 04යි.)

(iv) ගිහි ජීවිතයක පරිහානියට බලපාන හේතු වළක්වා ගැනීමෙන් දියුණුව උදාකර ගත හැකි බව පරාභව සූත්‍රාගත සාධක **පහක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05යි.)

(v) සම්පත් කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් පුද්ගලයාගේ ආර්ථික සුරක්ෂිතතාව පිණිස ඉවහල් වන ආකාරය විස්තර කරන්න. (ලකුණු 06යි.)

[ දෙවැනි පිටුව බලන්න.

## II කොටස

**4.** (i) උපත පදනම් කරගෙන මනුෂ්‍ය වර්ගයා උසස්-පහත් ලෙස වර්ගීකරණය කළ **නො හැකි බව** බෞද්ධ මූලාශ්‍රය සාධක ඇසුරින් පහදන්න. (ලකුණු 10යි.)

(ii) "ජනතාවට දැහැමි රක්ෂාවරණය හා ආර්ථික සුරක්ෂිතතාව සැලසීම රජුගේ ප්‍රධාන වගකීමකි." බෞද්ධ රාජ්‍ය පාලන මූලධර්ම ඇසුරින් විමසන්න. (ලකුණු 10යි.)

**5.** (i) බුද්ධකාලීන ධර්මදූත සේවාවේ සාර්ථකත්වය සඳහා බලපෑ හේතු සාධක පරීක්ෂා කරන්න. (ලකුණු 10යි.)

(ii) සෞන්දර්ය රසාස්වාදය පුද්ගලයාගේ ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා ඉවහල් කරගත හැකි ආකාරය බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් විවරණය කරන්න. (ලකුණු 10යි.)

**6.** (i) දෙවන ධර්ම සංගායනාව පැවැත්වීම සඳහා බලපෑ හේතු සාධක පැහැදිලි කර, එහි ප්‍රතිඵල සමාලෝචනය කරන්න. (ලකුණු 10යි.)

(ii) කනිෂ්ක රජතුමාගේ ශාසනික සේවය ප්‍රමාණවත් සාධක දක්වමින් ඇගයීමට ලක් කරන්න. (ලකුණු 10යි.)

**7.** (i) නාලන්දා විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන හා පරිපාලන ව්‍යුහය විස්තර කරන්න. (ලකුණු 10යි.)

(ii) ප්‍රාග් බෞද්ධ ලක්දිව පැවති ඇදහිලි හා විශ්වාස බුදුසමයට අනුකූලව හැඩ ගැසුණු ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 10යි.)

**8.** (i) ලක්දිව බුදුසසුනේ චිරස්ථිතිය සඳහා මහාවිහාරයෙන් ඉටු වූ සේවය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 10යි.)

(ii) "සඳකඩපහණ හෙළ කලාකරුවාගේ අදීනත්වය විදහා දක්වන විශිෂ්ට නිර්මාණයකි." විමසන්න. (ලකුණු 10යි.)

* * *